# කුරුණෑගල දිස්ත්‍රික්කයේ කාර්මික උරුමය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

දිනේෂා නීලනයනී අමරතුංග[43]

දිගු ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකාව, අධ්‍යයන පහසු ව තකා විවිධ යුග වලට බෙදා දැක්වීමට හැකි ය. ආදි නූතන යුගය ඉන් විශේෂ වේ. 18,19 වැනි සියවස් වලදී එංගලන්තයේ ඇති වූ කාර්මික විප්ලවය ලොව පුරා පැතිරී ගිය අතර මෙතෙක් කාලයක් දෑතේ වීර්යෙන් නිමවූ සියලු ම නිර්මාණ යන්ත්‍ර උපයෝගී කර ගෙන ක්‍රියාත්මක වීම සුවිශේෂ විය. 16 වැනි සියවසින් පසු ලංකාව යටත් විජිත ග්‍රහණයට  ප්‍රබල ව නතු විය. මාර්ග, ප්‍රවාහන, සනිවේදන සහ යටිතල පහසුකම් බ්‍රිතාන්‍ය තාක්ෂණය හා උපදේශකත්වය  මතම විය. වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය ට ද මෙම තත්ත්වයම බල පැවතියේ ය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ කාර්මික උරුමය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් කිරීම මෙහි දී සිදු වේ. කුරුණෑගල කාර්මික උරුමය පිළිබඳ පර්යේෂණයක් සිදුකර නොමැති වීම, කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් කාර්මික උරුමය සොයා ගැනීම, ලැයිස්තු ගත කිරීම,  වාර්තා කරණය මෙම පර්යේෂණයේ අරමුණු වේ. අධ්‍යයන ක්‍රමවේද ලෙස මහජනතාව සමඟ සාකච්ඡා කිරීම ග්‍රන්ථ පරිශීලනය කිරීමක්ෂේත්‍ර ගවේෂණ මගින් කාර්මික නිර්මාණ හා උරුම පිහිටන ස්ථාන පිළිබඳ තොරතුරු ඒකරාශි කර ගැනීම, අන්තර්ජාලය ඔස්සේ මෙම නිර්මාණ වල නිෂ්පාදිත ආයතන පිළිබඳ තොරතුරු ලබා ගැනීම කරන ලදි. අධ්‍යයනයේ දී ප්‍රවාහන ක්ෂේත්‍රය දුම්රිය, මහාමාර්ග වශයෙන් හඳුනා ගත හැකිය. දුම්රිය ආශ්‍රිත තලවත්තේගෙදර සිට සෙනරත්ගම දක්වාත්, පැරණි එංජිම්, ජල කුලුණු, පාලන බොත්තම්, පැරණි දොඹකර, දුම්රිය turn table, මෝටර් පොයින්ට්ස්, ගුන්ඩු පොයින්ට්ස්, ටැබ්ලට් සහ සංනිවේදන උපකරණ, පාලන මැදිරි ආදිය ද හඳුනාගන්නා ලදි. දුම්රිය ආශ්‍රිත පාලම් ද හමුවේ. ආරුක්කු හැඩය, කාප්ප, පරායනය විවිධත්වයක් ගනී.  සමකාලීන මාර්ග සකස් කිරීම් ගල් රෝල්  වාත්තු යකඩින් කළ විවිධ මාර්ග සංඥා පුවරු දක්නට ලැබිණි. යකඩ තාක්ෂණය හරහා පාලම් නිර්මාණය වී සම්බන්ධ වීමට නොහැකි ප්‍රදේශ කෙටි කාලයක් තුළ සම්බන්ධ කිරීමට හැකියාව ලැබි ඇත. කුරුණෑගල ඩිපෝව ආශ්‍රිත ව ද පැරණි බස් රථ හා නිර්මාණ හඳුනාගත හැකි ය. භාණ්ඩ ප්‍රවාහනය සඳහා භාවිත ඩක්කු දිස්ත්‍රික්කයේ තැනින් තැන හමු විය. පොදු පහසුකම් යටතේ ජල කරාම, නගරයේ හෝරා ස්ථම්භය විදුලි උපකරණ, ජල ටැංකි ආදී නිර්මාණයන් සහ ආරක්ෂාව සඳහා පොලිස් ස්ථාන ඇරඹීම ද විශේෂත්වයකි. සංවේදනය ආශ්‍රිත තැපැල් සේවාව, දුරකතන, ගුවන්විදුලි සහ රූපවාහිනී යන අංග පෙන්වා දීමට හැකිය. සිලින්ඩරාකාර තැපැල් පෙට්ටි, තැපැල් රිකිෂෝව, සංනිවේදන උපකරණ ද හමු විය. විවිධ කර්මාන්ත ආශ්‍රිත නිර්මාණ ද හමු විය. ශ්‍රී ලංකාව කාර්මික රටක් නොවුනත් සැළකිව යුතු කාර්මික උරුමයක් අප සතු ව පවතී. පවතින ඇතැම් කාර්මික නිර්මාණ බොහෝ පිරිස් දැක නොමැති අතරඒවා විනාශ වෙමින් පවතී. ආරක්ෂණයට හා නැරඹීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් සැපයිය යුතු අතර ම ඒ ඔස්සේ ශ්‍රී ලංකාවේ පවතින රැකියා ඌනතාවයට ද පිළියම් ලබා ගත හැකි වනු ඇත.

ප්‍රමුඛ පදඃකාර්මික උරුමය, ගුන්ඩු පොයින්ට්ස්, ආරුක්කු හැඩය

[43] පුරාවිද්‍යා හා උරුම කළමණාකරණ අධ්‍යයනාංශය,ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.